# සිංහල

# 僧伽罗语

## 第三册

佟加蒙 编




外语教学与研究出版社

සිංහල

# 僧伽罗语

## 第三册

佟加蒙 编



外语教学与研究出版社
北 京

# 前言

《僧伽罗语》第三册供大学僧伽罗语专业学生二年级下学期及三年级使用。

僧伽罗语有着严格的口语、笔语区别。对于学习者而言，从口语到笔语的过渡是一个难点较多而且容易引起认识混乱的环节。《僧伽罗语》第一册和第二册为口语教材，编有帮助学生掌握口语表达、口语语法和句法体系等内容。《僧伽罗语》第三册则力求解决从口语体到更为严谨的笔语体的转化问题，从而为高年级学生对笔语的深入学习打下基础。

本教材共收课文29篇，包括日常对话、故事、人物访谈、戏剧及小说节选等，涉及到社会、经济和文化等各方面内容。在选材上力求广泛，以便帮助学生在巩固提高语言能力的同时加强对对象国国情知识等方面的了解。

本教材中，部分补充内容选自原北京外国语大学僧伽罗语教研室的汇编资料。

本教材编写过程中，编者得到郑于中老师以及斯里兰卡凯拉尼亚大学（University of Kelaniya）佛教与巴利语系难达法师（Rev. Nanda）的指导和帮助，谨表感谢。教材中疏漏之处，恳请使用者指正。

编者

2006年12月

# පටුන

1. පාඩම කෙටි වාක්‍ය / ප්‍රශ්න සහ උත්තර..........................5
2. පාඩම ශ්‍රී ලංකාව සහ චීනය ..........................................12
3. පාඩම ආහාරය ...........................................................18
4. පාඩම උත්සවය ..........................................................24
5. පාඩම හරමානිස් (1) .................................................30
6. පාඩම හරමානිස් (2) .................................................39
7. පාඩම නරියාට වුණු දේ ................................................52
8. පාඩම කෙටි නාට්‍යයක් ................................................57
9. පාඩම අගනුවර ...........................................................64
10. පාඩම මනමේ ...........................................................69
11. පාඩම නිල්කැට (1) ..................................................75
12. පාඩම නිල්කැට (2) ..................................................83
13. පාඩම මීට සති කිහිපයකට පෙර ...................................103
14. පාඩම ප්‍රියංකාගේ ජීවිතය ............................................110
15. පාඩම පෙරහැරේ යන අලි සහ කොට අදින අලි.....................117
16. පාඩම ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය..................................123
17. පාඩම ඉතිහාසයට පෙම් බැඳි, ගමෙන් ආ මහාචාර්යවරිය..............128
18. පාඩම සරච්චන්ද්‍රයන්ගේ රාජදූත සේවාවේ සැමරුම් ස්වල්පයක්............135
19. පාඩම අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති ..................................141
20. පාඩම නුඹේ දෙපාවලට යෝධබල යෝධ ශක්තිය ලැබේවා.................147
21. පාඩම ආර්ථික ප්‍රතිපත්ති සංශෝධනය (1) ..........................154
22. පාඩම ආර්ථික ප්‍රතිපත්ති සංශෝධනය (2) .......................... 160
23. පාඩම ශ්‍රී ලංකාව.........................................................171
24. පාඩම රන් පුහුල තඹ පුහුලක් වන විට ..................................181
25. පාඩම නිවටයා කන්ද ඉවත් කළ හැටි....................................191
26. පාඩම කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව............................202
27. පාඩම සෙන් යක් රූසෝ...................................................213
28. පාඩම ලංකාවේ අතීතය...................................................225
29. පාඩම ජනතාවට සේවය කරමු............................................234

此为试读，需要完整PDF请访问：www.ertongbook.com

# 1. පාඩම කෙටි වාක්‍ය / ප්‍රශ්න සහ උත්තර

## 1. කෙටි වාක්‍ය

1) ශබ්ද කරන්න බොහොම ලේසියි.
2) සමහර අකුරු කොටයි.
3) අනෙක් අකුරු දිගයි.
4) අකුරු කොටස් දෙකක් තියෙනවා.
5) පළමුවන කොටසට ස්වරයයි කියනවා.

6) අපි අකුරු ඉගෙන ගන්නවා.
7) අපි අකුරු ශබ්ද කරනවා.
8) අනෙක් කොටසට ව්‍යාංජනයයි කියනවා.
9) අපි අකුරු ලියනවා.
10) අකුරු ලියන්න ලේසියි.

11) අපි සිංහලෙන් කතා කරනවා.
12) අපට සිංහල කතා කරන්න පුළුවන්.
13) අපි පාඩම් තිහක් ඉගෙන ගන්නවා.
14) ඒවා මට හොඳට තේරෙනවා.
15) මට ලස්සණට ලියන්න පුළුවන්.

16) මම ලියන අකුරු ලොකුයි.
17) පස්සේ පුංචියට අකුරු ලියනවා.
18) හැමදා ම මම පත්තර කියවනවා.
19) පත්තර කියවීමෙන් දැනීම දියුණු වෙනවා.
20) අපේ ගෙදර සිංහල පොත් තිබෙනවා.

21) මගේ හිස්කෙස් පැහිලා.
22) පියාගේ දත් වැටිලා.
23) පියදාස, ඇඟිල්ල කැපුනේ කොහොම ද?

24) මැලේරියා උණ බෝ වෙන ලෙඩක්.
25) අමුත්තෝ සාලේ වාඩි වෙලා සිටිනවා.

26) මම ගෙවල් හදනවා.
27) නංගි ජනෙල් වහනවා.
28) අම්මා කොට්ට අව්වට දානවා.
29) මම තව පැයකින් යනවා.
30) මේ අවුරුද්දේ වැස්ස අඩුයි.

31) ඉරිදා ආණ්ඩුවේ නිවාඩු දවසකි.
32) පෙරේදා අපි නුවර ගියා.
33) මෙතන පුටු කීයක් තියෙනවා ද?
34) පුටුවක් කීයක් වෙනවා ද?
35) දුම්රිය පිට වෙන්නේ කීයට ද?

36) මෙතන එතනට වඩා හෙවන තිබෙනවා.
37) විභාගය කවදා ද?
38) විභාගයට එන්නේ කවු ද?
39) විභාගෙ තියෙන්නේ කොතන ද?
40) විභාගෙ වැඩ කොහොම ද?

## 2. ප්‍රශ්න සහ උත්තර

1) ගෙදර දී

ප: පුතා, ඇයි අද ස්කෝලේ යන්නේ නැද්ද?

උ: නැහැ, තාත්තා, අද අපට නිවාඩු දවසක්.

ප්‍ර: මොකක් නිසා ද?

උ: මධ්‍යවාරය නිසා.

ප: මොකක් ද පුතා, මධ්‍යවාරය කියන්නේ?

උ: තාත්තේ, වාරේ දී ලැබෙන දවසක හෝ දෙකක නිවාඩුව.

ප්‍ර: ඇයි තාත්තා දන්නේ නැද්ද?

උ: මම දන්නවා. මට උවමනා කළේ පුතා දන්නවා ද කියලා දැන ගන්නයි.

2） තැපැල් කන්තෝරුවේ දී

ප: මේ ලියුම ලියා පදිංචි කරන්න කීයක් ගෙවන්න ඕනෑ ද?

උ: ශත 35යි.

ප: යවන තැනැත්තාගේ නම ලියලා නැහැ නේ ද?

උ: අනිත් පැත්තේ ලියා තිබෙනවා.

3） භෝජන ශාලාවේ දී

ප: ළමයෝ, කෑමට තියෙන්නේ මොනවා ද?

උ: බත්, පාන්.

ප: දැන් පාන් කන වෙලාව පහු වෙලා. බත් අද එවා ද?

උ: ඔව්, ඔව්, මේ දැන් හදාපුවා. තවම දුම් දානවා.

ප: මොකද ළමයෝ, දුම් දානවා කියාපු බත් අයිස් වාගේ සීතලයි නේ?

උ: ඒ මහත්තයෝ, අයිස් පෙට්ටිය ළඟ තිබ්ලා.

4） කාර්යාලයේ දී

ප: කෝ මේ සම්බන්ධ ලියුම?

උ: එක අපට ලැබිලා නෑ.

ප: එය එවා තිබෙන්නේ ලියා පදිංචි කළ තැපැලෙන් නේ ද?

උ: ඔව්.

ප: එය භාර ගත්තේ කවු ද?

උ: දන්නේ නෑ.

ප්‍ර: මේ ගැන තැපැල් ස්ථානාධිපතිට දැන්නුවා ද?

උ: තවම නෑ.

ප්‍ර: ඇයි?

උ: නියෝගයක් නැති නිසා.

ප්‍ර: වහාම දන්වන්න.

## වචන මාලාව

| | |
|---|---|
| ශබ්ද කරනවා | 发音，发出声响 |
| කොට | 短的 |
| ස්වරය | 元音 |

| | |
|---|---|
| ව්‍යාංජනය | 辅音 |
| පුංචි | 小的 |
| දැනීම | 知识 |
| හිස්කෙස් | 头发 |
| ඇඟිල්ල | 手指 |
| මැලේරියා | 疟疾 |
| උණ | 发烧 |
| බෝ වෙනවා | 传染 |
| සාලය | 厅 |
| අමුත්තා | 客人 |
| කොට්ට | 枕头 |
| සෙවන | 阴凉 |
| ස්කෝලය | 小学，中学 |
| නිවාඩුව | 假期 |
| මධ්‍යවාරය | 期中 |
| උවමනා | 需要 |
| තැපැල් කන්තෝරුව | 邮局 |
| ලියා පදිංචි කරනවා | 注册，登记 |
| තැනැත්තා | 人 |
| භෝජන ශාලාව | 餐厅 |
| පහු වෙනවා | 错过，经过 |
| දුම් දානවා | 冒烟，冒热气 |
| අයිස් පෙට්ටිය | 冰箱 |
| කාර්යාලය | 办公室 |
| ස්ථානාධිපති | 站长 |
| නියෝගය | 命令 |
| වහා | 立刻，马上 |

## සටහන්

（1）不定式的用法：

不定式加形容词，表达动作的属性；

例如：ශබ්ද කරන්න බොහොම ලේසියි.

අකුරු ලියන්න ලේසියි.

不定式加情态动词；

例如：අපට සිංහල කතා කරන්න පුළුවන්.

මේ ලියුම ලියා පදිංචි කරන්න කීයක් ගෙවන්න ඕනෑ ද?

不定式作状语；

例如：මේ ලියුම ලියා පදිංචි කරන්න කීයක් ගෙවන්න ඕනෑ ද?（目的状语）

මට උවමනා කළේ පුතා දන්නවා ද කියලා දැන ගන්නයි.

不定式用于祈使句；

例如：වහා ම දන්වන්න.

（2）形容词加"ට"，作副词：

例如：මට ලස්සණට ලියන්න පුළුවන්.

ඒවා වට හොඳට තේරෙනවා.

（3）特殊疑问句：

විභාගය කවදා ද?

（星期几考试？）

විභාගයට එන්නේ කවු ද?

（谁来参加考试？）

විභාගෙ තියෙන්නේ කොතන ද?

（考试在什么地方？）

විභාගෙ වැඩ කොහොම ද?

（考试怎么样？）

ඇයි අද ස්කෝලේ යන්නේ නැද්ද?

（为什么不去上学？）

මොකක් නිසා ද?

（因为什么？）

මධ්‍යචාරය කියන්නේ?

（所指是什么），例如：ඒ කියන්නේ?

මේ ලියුම ලියා පදිංචි කරන්න කීයක් ගෙවන්න ඕනෑ ද?

（发挂号信需要付多少钱？）

## අභ්‍යාස

1）පහත දැක්වෙන වාක්‍ය සිංහල භාෂාවට පෙරළන්න.

（1）我们能用僧伽罗语讲话。
（2）我每天都看报纸。
（3）客人在客厅里坐着。
（4）我一个小时后走。
（5）今年雨水很少。
（6）火车几点开？
（7）这把椅子多少钱？
（8）考试考得怎么样？

---

（1）今天我们放假。
（2）买这把椅子花了多少钱？
（3）这封信需要挂号。
（4）这米饭是冰凉的，没法吃。
（5）那封信收到了吗？
（6）请立刻通知他。
（7）我需要知道是谁拿了那本书。

2）පහත දැක්වෙන වචන යොදා වාක්‍ය තනන්න.

ලේසි　　　　දියුණු වෙනවා

ඉගෙන ගන්නවා　　　　කැපෙනවා



此为试读，需要完整PDF请访问：www.ertongbook.com

| | |
|---|---|
| පුළුවන් | කොහොම ද |
| නිවාඩුව | දුම් දානවා |
| උවමනා වෙනවා | වගේ |
| ලියා පදිංචි කරනවා | ළඟ |
| වෙලාව | සම්බන්ධ වෙනවා |




科伦坡街景

# 2. පාඩම ශ්‍රී ලංකාව සහ චීනය

## 1. ශ්‍රී ලංකාව සහ චීනය

ශ්‍රී ලංකාව

ඉන්දියන් සාගරේ දූපතක් වන ශ්‍රී ලංකාව පෙරදිග මුතු ඇටය නමින් මුළු ලෝකයේ ම ප්‍රසිද්ධයි. කෝටි දෙකක විතර ජනගහණයක් ඇති එම රටේ ප්‍රධානම ජාතිය සිංහල ය. ඊට අමතර ව දෙමළ, මුස්ලිම්, මැලේසියන් යනාදි ජාති එහේ තිබෙනවා.

නොයෙක් පෙරදිග රටවල් වගේ ම ලංකාව ද දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. ක්‍රි. පූ. හය වෙනි ශතවර්ශය තරම් පැරණි කාලයේ ඉඳලා ලාංකිකයෝ ඒ දූපතේ පදිංචි වෙන්න පටන් ගත්තා. දහසය වෙනි ශතවර්ශය, ඒ කියන්නේ යටත් විජිතවාදයන් ලංකාවට එන්න කලින් එහේ රාජ පරපුර තිබුණා. 1948දී ලංකා ජනතාව බ්‍රිතාන්‍ය රජයෙන් නිදහස් ලබා ගත්තා.

භූමි ප්‍රමාණය ඉතා ම විශාල නොවුණත් ශ්‍රී ලංකාවේ දීප්තිමත් බුද්ධ දහම, සම්භාව්‍ය සාහිත්‍ය සම්ප්‍රදාය, විශේෂ ලක්ෂණ ඇති සංගීත නැටුම් කලාව තියෙනවා.

චීනය

පෙරදිග ආසියාවේ පිහිටා තිබෙන චීනයේ ජනගහණය කෝටි එක සිය තිහක් විතර වෙනවා. චීනයේ ජනතාව හන්, හුවි （මුස්ලිම්）, මැන්, මොංගෝලිය යනාදී ජාතීන් පණස් හයකට අයිත් වෙනවා.

පැරණි කාලයේ සිට 1911 දක්වා චීනයේ රාජ පරපුර දහ අටක් අනුපිළිවෙලින් තිබුණා. 1911 දී රාජ්‍ය විප්ලවයක් නිසා වැඩවසම් ක්‍රමය බිඳුණා. එක් දාස් නවසිය හතලිස් නමයේ ඔක්තෝබර් මාසයේ පළමුවෙනි දා චීන මහජන සමුහාණ්ඩුව පහළ වුණා.

බටහිර හා මැද පෙරදිග රටවල් මෙන් ම ජපානය, කොරියාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව වගේ රටවල් සහ චීනය අතර අතීත කාලයේ ඉඳලා සම්බන්ධතා පවත්වා තිබෙනවා.

## 2. අපේ ගෙය

අපේ ගෙය හදලා තියෙන්නේ ගම මැද. එය දෙමහල් ගොඩනැගිල්ලක්. බිමට සිමෙන්ති දාලා තියෙනවා. අපේ ගේ දිග අඩි හතලිහක් විතර වෙනවා. පළල අඩි තිස් අටක්, උස අඩි විසි පහක් විතර වෙනවා. එහේ බිම ප්‍රමාණය වර්ග අඩි දාහකට වැඩියි. පහත මාලය කාමර කිහිපයකට බෙදා තිබෙනවා. ඉන් හතරක් නිදන කාමරයි. අනික කෑම කන කාමරයයි. උඩ තට්ටුව විශාල සාලාවක්. හැම කාමරයකට ම දොරවල් හා ජනේල තියෙනවා. දොර ජනෙල්වලින් ඉර එළිය ලැබෙනවා. කුස්සිය හදලා තියෙන්නේ ගෙයි පිටි පස්සේ. කුස්සියට දකුණු පැත්තෙන් ලිදකුයි වම් පැත්තෙන් වැසිකිළියක් තනලා තියෙනවා. අපේ ගෙයට ඉතා කිට්ටු ගෙය තියෙන්නේ යාර සීයක් විතර දුරින් ය. නගර බද ගෙවල් එකින් එකට කිට්ටුව හදලා ඇත. නගරයේ ඉඩ කඩ හිඟවීම මීට හේතුවයි.

අපේ ගෙට අපි ආදරෙයි. අම්මා, තාත්තා, අයියා, අක්කා, මල්ලි හා නංගිලා මේ ගෙදර වාසය කරනවා. සීයයි ආච්චියි පරණ ගෙයි නැවතිලා ඉන්නවා. ඔවුන්ට උදව් කිරීමට නැන්දායි මාමායි එහේ වාසය කරනවා. හැම දෙනා ම නිතර අපේ ගෙදර එනවා. අපේ ගෙදර වැඩට කුස්සි අම්මා කෙනෙකුයි පිරිමි ළමයෙකුයි ගෑණු ළමයෙකුයි ඉන්නවා. තාත්තා ආණ්ඩුවේ කන්තෝරුවක රක්ෂාව කරනවා. අම්මා ගුරුවරියක්. ගෙදර දොර බලාගෙන වතුපිටිවල ආදායම් රැස් කරන්නේ අයියායි. අය වැය හොඳට දන්නේ අයියා විතරයි.

### වචන මාලාව

| | |
|---|---|
| ඉන්දියන් සාගරය | 印度洋 |
| පෙරදිග | 东方 |
| මුතු ඇටය | 珍珠 |
| කෝටිය | 千万 |
| ජනගහණය | 人口 |
| අමතර | 之外，另外 |
| දීර්ඝ | 长的，悠久的 |
| ක්‍රි. පූ. （ක්‍රිස්තු පූර්ව） | 公元前 |
| යටත් විජිත වාදය | 殖民主义 |

| | |
|---|---|
| රාජ පරපුර කාලය | 王朝，朝代 |
| බ්‍රිතාන්‍යය | 英国 |
| භූමි ප්‍රමාණය | 土地面积 |
| දීප්තිමත් | 辉煌的，灿烂的 |
| ලක්ෂණ | 特点 |
| සම්භාව්‍ය | 经典的，古典的 |
| බුදු දහම | 佛教 |
| අනු පිළිවෙළ | 按次序的，逐次的 |
| විප්ලවය | 革命 |
| වැඩවසම් | 封建的 |
| බිඳෙනවා | 粉碎，破碎 |
| සමූහාණ්ඩුව | 共和国 |
| බටහිර | 西方的 |
| සම්බන්ධතාව | 关系 |
| මැද | 中间 |
| මහල | 层 |
| සිමෙන්ති | 水泥 |
| අඩි | 英尺 |
| බෙදනවා | 分，划分 |
| තට්ටුව | 楼层 |
| ඉර එළිය | 阳光 |
| කුස්සිය | 厨房 |
| වැසිකිළිය | 厕所 |
| යාර | 码（长度单位） |
| හිඟ වෙනවා | 缺少 |
| වාසය කරනවා | 居住 |
| කුස්සි අම්මා | 厨娘 |
| කන්තෝරුව | 办公室 |
| ආදායම | 收入 |
| අයවැය | 收入支出，预算 |

## සටහන්

（1）ඉන්දියන් සාගරේ දූපතක් වන ශ්‍රී ලංකාව පෙරදිග මුතු ඇටය නමින් මුළු ලෝකයේ ම ප්‍රසිද්ධයි.

（斯里兰卡是印度洋上的一个岛国，以“东方明珠”的美誉闻名世界。）

වන 意思是“作为”，用作名词和修饰定语之间的连接词；

නමින් 意思是“以什么之名”，“以什么的名义”。

（2）දහසය වෙනි ශතවර්ෂය, ඒ කියන්නේ යටත් විජිතවාදයන් ලංකාවට එන්න කලින් එහේ රාජ පරපුර තිබුණා.

（16 世纪，也就是殖民主义者到来之前，是斯里兰卡的封建王朝时期。）

රාජ පරපුර කාලය 意思是“王朝”。例如：唐朝 ටං රාජ පරපුර කාලය.

（3）භූමි ප්‍රමාණය ඉතා ම විශාල නොවුණත් ශ්‍රී ලංකාවේ දීප්තිමත් බුදු දහම, සම්භාව්‍ය සාහිත්‍ය සම්ප්‍රදාය, විශේෂ ලක්ෂණ ඇති සංගීත නැටුම් කලාව තියෙනවා.

（斯里兰卡的国土面积不大，但是有历史悠久的佛教和古典文化传统，以及特点鲜明的音乐和舞蹈艺术。）

බුදු දහම 意思是“佛教，佛陀的教义”。

（4）පැරණි කාලයේ සිට 1911 දක්වා චීනයේ රජ පරපුර දහ අටක් අනුපිළිවෙලින් තිබුණා. 1911 දී රාජ්‍ය විප්ලවයක් නිසා වැඩවසම් ක්‍රමය බිඳුණා.

（从古代到 1911 年，中国历史上各个王朝更替存在。1911 年的辛亥革命，终结了封建制度。）

සිට 和 දක්වා 为“从什么时间开始，到什么时间结束”的笔语表达方式；සිට 之前用位置格。

අනුපිළිවෙලින් 意思是“按次序的”。

（5）කුස්සියට දකුණු පැත්තෙන් ළිඳකුයි වම් පැත්තෙන් වැසිකිළියක් තනලා තියෙනවා.

（厨房右边有一口井，左边修了个卫生间。）

දකුණු පැත්තෙ 意思是表示方向的“南”和“右”均用 දකුණු。

## අභ්‍යාස

1）පහත දැක්වෙන වාක්‍ය සිංහල භාෂාවට පෙරළන්න.

（1）斯里兰卡被称为印度洋上的一颗明珠。
（2）中国的人口约有13亿。
（3）斯里兰卡的历史很悠久。
（4）殖民主义者在16世纪初到达斯里兰卡。
（5）中国有56个民族。
（6）中华人民共和国于1949年10月1日成立。
（7）中国和许多亚洲国家从古代就有良好的关系。

---

（1）这是一座两层楼房。
（2）阳光从窗户和门口处照进来。
（3）我和爸爸妈妈、爷爷奶奶一起生活。
（4）爸爸在国家机关工作。
（5）他的家有四个卧室、一个大客厅、一个卫生间和一个厨房。

2）පහත දැක්වෙන වචන යොදා වාක්‍ය තනන්න.

| | |
|---|---|
| මුළු | ඉතාම |
| නොයෙක් | පදිංචි වෙනවා |
| පැරණි | යනාදිය |
| රාජ පරපුර | සම්ප්‍රදාය |
| ජනතාව | අයිති වෙනවා |
| නිදහස් | පහළ වෙනවා |
| ගොඩනැගිල්ල | උදව් කරනවා |



此为试读，需要完整PDF请访问：www.ertongbook.com